2019.03.03 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1984.02.28

## තිතේ හා බින්දුවේ හරය.

අද දින, අහිංසකත්වයේ ස්වාමියා වන පරමාත්ම පියා, තම අහිංසක දරුවන්ව මුණ ගැසීමට පැමිණ සිටින්නේ දරුවන්ගේත් පියාගේත් අවතරණයේ දිනය හෙවත් අසහාය ආධ්‍යාත්මික උපත් දිනය සැමරීමටයි. අහිංසක පියාගේ සෙනෙහසට ලක් වන්නේ අහිංසක දරුවනුයි. "අහිංසක" යනු නිරන්තරයෙන් පහසු ගති ස්වභාවයක් පවත්වා ගැනීමයි, මනසේ හා කරන–කියන දේ අවංකව හා පිරිසිදුව කිරීමයි, එවන් අහිංසක දරුවන් පරමාත්ම පියාගේ ආකර්ෂණය දිනාගනී. අහිංසකත්වයේ ස්වාමියා වන පරමාත්ම පියා අහිංසක දරුවන්ගේ ගුණ මාලාවේ මල් ගණන් කරමිනුයි සිටින්නේ. ඔබ සැම කෙනෙක්ම උපත් ගණනාවක් පුරා පරමාත්ම පියාගේ නාමයෙන් බිජ ගණන් කර කර සිටියා, සංගම යුගයේ දී පරමාත්ම පියා ඔබට ඒ වෙනුවෙන් කළගුණ දක්වනවා. දරුවන්ගේ ගුණ මාලාවේ බිජ සියල්ලම ඔහු ආපසු දෙනවා. අහිංසකත්වයේ ස්වාමියා සියලුම අහිංසක දරුවන්ට බොහෝම ආදරෙයි. ඔබලා ඥාන ප්‍රතිමූර්තීන් වන තරමට, ඥානයෙන් පිරි බලයෙන් පිරි අයෙක් බවට පත්වුණු තරමට ඔබලා අහිංසක ද වේ. දෙවියන් කැමති වන්නේත් අහිංසකත්වයටයි. ඔබගේ මෙම උසස් වාසනාව ගැන ඔබලා දන්නවා නේද ? ඔබ පරමත්ම දෙවියන්වත් ආකර්ෂණය කරගත්තා; ඔබ ඔහුව අයිති කරගත්තා.

අද දවස බැතිමතුනුත් දරුවනුත් සඳහා වන විශේෂයෙන්ම සැමරීමේ දිනයයි. බැතිමතුන් සියල්ල සූදානම් කරගෙන ඔහුව කැඳවනවා, ඒත් ඔබලා ඔහු ඉදිරියේම අසුන්ගෙන සිටිනවා. බැතිමතුන්ගේ දිව්‍යමය ක්‍රියා දැක පරමාත්ම පියා සිනහ වෙනවා, ඒ වගේම දරුවන්ගේ හමුවීමේ සෙල්ලම් දකින්නත් ඔහු කැමතියි. එක් පැත්තකින් තමාගෙන් වෙන්වුණු බැතිමත් ජීවාත්මයන් සිටිනා අතර අනිත් පැත්තෙන් ඔය පහසු යෝගී දරුවන්. දෙගොල්ලන්ගේම සෙනෙහස නිසා ඒ දෙගොල්ලන්ම සෙනෙහසට පාත්‍ර වෙනවා. බැතිමතුනුත් දෙවෙනි නැහැ. හෙට, ඔබගේ සුවිශේෂී, ආදරණීය දේවතාවරුන්ගේ ඉටු දෙවි ස්වරූපයෙන් සැම තැනකටම ගිහින් බලන්න. පරමාත්ම පියා සමඟ සළිග්‍රාම දරුවනුත් විශේෂයෙන්ම වන්දනාවට ලක්වෙනවා. බලන්න බැතිමතුන් පරමාත්ම පියා සමඟ ඔය දරුවන්ව වන්දනාකරන ආකාරය. දැන්, අවසාන කාලයේ දීත් ඉතාමත් මහත් වූ ශ්‍රද්ධා භක්තියකින් වන්දනා කටයුතු කර තාවකාලික කාලයකට තම වන්දනාවේ ඵල ලබන, ප්‍රභල බැතිමතුන් සිටිනවා. හෙට දවස බැතිමතුන්ගේ භක්තිය සඳහා වන විශේෂ සෙනෙහසේ දිනයයි. ඔබට තේරුණා ද ?

ඔබ සැම කෙනෙක්ම පරමාත්ම පියාගේ උපත් දිනය සමරනවා ද නැතිනම් ඔබගේඋපත් දිනය සමරනවාද ? මුලු කල්පය පුරාවටම, පියාගේත් දරුවන්ගේත් උපත් දිනය එකම දවසකට වැටෙන්න හැකියාවක් තිබෙනවා ද ? එකම දිනය වුණත් එකම අවුරුද්ද වෙන්න බැහැ; පියාත් දරුවනුත් අතර කුඩා හෝ වෙනසක් ඇති වේවි. ඒ කෙසේ වෙතත්, පරමාත්ම පියාගේත් දරුවන්ගේත් අලෞකික උපත් දිනය යෙදී ඇත්තේ එකම මොහොතකටයි. තමන් පරමාත්ම පියාගේ උපත් දිනය සමරනවායි කියා ඔබ කියාවි, ඒ වගේම ඔහු කියාවි තමන් දරුවන්ගේ උපත් දිනය සමරනවායි කියලා. එමනිසා, එය හරිම අපූරු උපත් දිනයක් නේද ? ඔබලා තමන්ගේම උපත් දිනයත් පරමාත්ම පියාගේ උපත් දිනයත් සමරනවා. ඉතින් එහෙමනම් බලන්න, අහිංසකත්වයේ ස්වාමියා වන පරමාත්ම පියා ඔය දරුවන්ට කෙතරම් නම් ආදරේ ද කියලා, උපත් දිනත් එකම දවසටයි වැටී තිබෙන්නේ. ඉතින් ඔබලා මේ තරමින් අහංසකත්වයේ ස්වාමියාව ආකර්ෂණය කරගෙන තිබෙනවා, නේද ? බැතිමතුන් තමන්ගේ භක්තියෙන් කුල්මත්වෙලා, ඔබලා සියල්ල ලැබීමේ සතුටින් ගී ගයා නටමින් උත්සව සමරනවා. නිර්මාණය වී ඇති සිහිවටනයේ විශාල වැදගත්කමක් තිබෙනවා.

ඔවුන්ගේ වන්දනා කටයුතු වලත් පිළිම වලත් විශේෂතා දෙකක් තිබෙනවා. එකක් තිතේ විශේෂත්වය අනෙක සැම බිඳුවකම විශේෂත්වය. ඔවුන්ගේ වන්දනාවේ ක්‍රමයට අනුව, ඔවුන් සැම බිඳුවකටම වැදගත්කමක් දෙනවා. මේ කාලයේ දී ඔය දරුවන් තිතේ හරය මත ස්ථාවර වී සිටිනවා. මුලු ඥාන සම්භාරයේම හරය තිත යන එකම එක වචනය තුළ අන්තර්ගතව තිබෙනවා. පරමාත්ම පියා තිතක්, ඔය ජීවාත්මයනුත් තිත්, නාටකය පිළිබඳ ඥානය උකහා ගැනීම සඳහා, සිදුවුණු සැම දෙයක්ම සිදු වී හමාරයි, එනම්, ඔබ නැවතීමේ තිතක් තබනවා. මුලු ගසෙහිම නාටකය පිළිබඳ ඥානය එනම්, පරමාත්ම ජීවය, ජීවාත්මය හා පදාර්ථය – ඔබ සෙල්ලමක් ලෙසින් තම ප්‍රායෝගික ජීවිතයේ කරුණක් ලෙසින් අත්දකිනවා. මෙන්න මේ නිසා තමයි භක්තියේ දී පවා ප්‍රතිමාවක මැද තිතට වැදගත්කමක් දී තිබෙන්නේ. දෙවැන්න බිංදුවල වැදගත්කමයි. ඔබ සැම කෙනෙක්ම පියාව සිහිකරමින් අන් අයවත් සිහිකිරීමේ අසුන් ගන්වාගත් විට යොදාගන්නා ක්‍රමවේදය මොකක්ද ? සිතිවිලි බිජ. පළමු බිංදුව : මම ජීවාත්මයක්, දෙවන බිංදුව : මම පරමාත්ම පියාගේ දරුවෙක්. පිරිසිදු සිතිවිලි බිඳු හමුවක සාර්ථකත්වය ඔබ අත්දකිනවා. ඉතින් පළමුව, පිරිසිදු සිතිවිලිවල අවධානයේ බිඳුවයි. දෙවැන්න හදවතට සමීප ලෙන්ගතු කතාබහේ දී; පරමාත්ම පියාගේ ගුණ වර්ණනාවේ පිරිසිදු සිතිවිලි බිඳු ඔබ ඉසිනවා. ඔබ මේ වගේයි, ඔබ මාව මේ වගේ කර තිබෙනවා. එවන් මිහිරි, සීතල බිඳු ඔබලා පරමාත්ම පියා මත ඉසිමින් ඔබලා හෘදයාංගම කතා බහක නිරත වෙනවා. සැම කරුණක්ම එකින් එක කියා පසුව ඔබලා ඒ ගැන සිතනවා. සැම දෙයක් ගැනම එකම විට සිතන්නේ නැහැ. තෙවනුව, සැම දරුවෙක් මතම ශරීරයේ, මනසේ හා ධනයේ සහයෝගයේ දිය බිඳු ඉසිනවා. මෙන්න මේ නිසා තමයි ඔබලා බිඳෙන් බිඳ පිරෙන පොකුණ ගැන සඳහන් කරන්නේ. ලෝක පරිවර්තනයේ එම විශාල කාර්යභාරය සඳහා, සියලු බල ඇත්තාගේ අසීමිත කාර්යය සඳහා ඔබලා දක්වන සැම සහයෝගයක්ම සහයෝගයේ බිඳු කියා තමයි හඳුන්වන්නේ. කොහොමනමුත්, සැම කෙනෙකුගේම සහයෝගයේ බිඳ බිඳ එකතු වී එය සහයෝගයේ අසීමිත සාගරයක් බවට පත්වෙනවා. මෙන්න මේ නිසා තමයි වන්දනා කටයුතු වලදීත් බිඳෙන් බිඳ යන්නට වටිනාකමක් දී තිබෙන්නේ.

උපවාස සීලයක් සඳහා වන විශේෂ වන්දනා ක්‍රමයක් ඔවුන් පෙන්වනවා. ශීලයක් රකිනවා. පරමාත්ම පියාට සහයෝගය දැක්වීම සඳහා ඔබ කිසිම නිශ්ඵල සිතිවිල්ලක අහරක් නොගැනීමේ සීලය රකිනවා, තමන් කවදාවත් අපිරිසිදු හෝ නිශ්ඵල සිතිවිලි තම බුද්ධියට ගන්නේ නැහැයි කියා පොරොන්දු වෙනවා. මෙම සීලය ඔබ ගන්නවා, එය අධිෂ්ටානයක්, ඒ වෙනුවට බැතිමතුන් අපිරිසිදු ආහාර නොගැනීමේ සීලය රකිනවා. මේත් සමගම ඔබලා සදා කාලයටම දැල්වුණු පහන් වන අතර එහි සිහිවටනය ලෙසින් ඔවුන් මුලු රැය පුරාම අවදිව සිටිනවා. ඔය දරුවන්ගේ අවිනාශී, ආධ්‍යාත්මික, අභ්‍යන්තර ගතවුණු ක්‍රමවේද බැතිමතුන් විසින් භෞතික ක්‍රමවේදයක් ලෙසින් ක්‍රියාවට නංවනවා. කෙසේවෙතත්, ඔවුන් ඔය දරුවන්ව කොපි කර තිබෙනවා. ඔවුන්ට තිබෙන රජෝප්‍රධාන් බුද්ධිය නිසා, තමන්ට හොඳයි කියා දැනෙන සෑම දෙයක් මතම මෙවන් ක්‍රමවේද නිර්මාණය කරගෙන තිබෙනවා. අංක එකේ රජෝගුණී බැතිමතෙක් වීමේත් භක්තියේත්, සතෝගුණී බැතිමතෙක් වීමේත් බ්‍රහ්මාත් ඔය විශේෂ ජීවාත්මයනුත් තමයි මේ සඳහා උපකරණ වන්නේ. කෙසේවෙතත්, පළමුව ඔබගේ හිතේ ඇති සෙනෙහස නිසාත් හිතේ ශක්තිය නිසාත්, පළමුවෙන්ම ආරම්භ වන භක්තිය වන්නේ හිතේ හැඟීම් වලිනුයි. ඒ භෞතික ක්‍රම පසුව ක්‍රම  ක්‍රමයෙන්  ඇරඹෙනවා. ඒ වුණත්, තම නිර්මාණය වන භක්තිවන්ත ජීවාත්මයන්ගේ ක්‍රමවිධි දැක නිර්මාණකරු වන පරමාත්ම පියා කියනවා : බැතිමතුන්ගේ බුද්ධිය ස්පර්ෂ කිරීමේ පුදුමයයි කියලා. ඒ වුණත් ඒ ක්‍රම මත තම බුද්ධිය මෙහෙය වීම නිසා ඔවුන් යම් තරමකින්හෝ පාපයෙන් ආරක්ෂා වී සිටිනවා. භක්තිය පුරාවට යන සැබෑ සාර්ථකත්වයේ ක්‍රමය ඔබලාට තේරෙනවාද ? සිහිවටනයේ වැදගත්කම මෙයයි.

ඩබල් විදේශී දරුවන් එතරම් භක්තියක් දකින්නේ නැහැ. කෙසේවෙතත්, ඒ සෑම කෙනෙක්ම ඔබ සෑම කෙනෙකුගේම බැතිමතුන්ය. බැතිමතුන්ගේ දිව්‍යමය ක්‍රියා ඔය දරුවන් අත්විඳිය යුතුයි, භක්තිවන්ත ජීවාත්මයන් අදටත් වන්දනාමාන කරමින් ඔය පූජනීය ජීවාත්මයන්ව කැඳවන්නේ කෙසේද කියා බැලිය යුතුයි. ඔබට මෙය දැනෙනවා ද ? බැතිමතුන්ගේ ඒ කන්නලව්ව ඔබලාට දැනෙනවා ද ? ඔවුන් ගැන ඔබට කරුණාවක් හිතෙනවා ද ? බැතිමතුන් ගැන ඔබලාට ඉතාමත් පැහැදිලි අවබෝධයක් තිබෙනවා නේද ? බැතිමතුන් කන්නලව් කරද්දී ඔබලාට එය තේරෙන්නේ නැතිනම්, බැතිමතුන්ට කුමක් සිදුවෙයි ද ? මෙන්න මේ නිසා තමයි බැතිමතුන් කරන්නේ කුමක්ද, වන්දනාකරුවන් කවුරුන් ද, වන්දනීය ජීවාත්මයන් කවුරුන්ද යන දේවල් පිළිබඳ පැහැදිලි වැදගත්කමක් ඔබ දැන සිටිය යුත්තේ. වන්දනීය වීමේත් වන්දනාකරුවෙක් වීමේත් හරය ඔබලා දන්නවා නේද? අච්චා. බැතිමතුන්ගේ කන්නලව්ව ඔබලාට දැනෙනවා ද ? ඔය පාන්ඩවයින්ටත් එය ඇසෙනවා ද, නැතිනම් ශක්තීන්ලාට පමණක් ද ඇසෙන්නේ ? සලිග්‍රමයින් රාශියක් තිබෙනවා. සිය දහස් ගණනක් තිබෙතනවා. නමුත් දේවතාවරුන් සිය දහස් ගණනක් ඇත්තේ නැහැ. අච්චා. මෙහි වැදගත්කම ගැන බාබා වෙනත් දවසක කියන්නම්. මුලදී පැමිණි සියලුම ඩබල් විදේශිකයින්, ශක්තීන් වේවා පාන්ඩවයින් වේවා මුලදී පැමිණ ආදර්ශමත් අය බවට පත් වූවන් තුළත් විශේෂතා තිබෙනවා. පළමුවෙන්ම, ලොකුම විදේශිකයා වන්නේ පරමාත්ම පියායි. වැඩිම කාලයක් විදේශීය තැනක සිටින්නේ කවුද ? පරමාත්ම පියා තමයි වැඩියෙන්ම සිටින්නේ.

දැන් දවසින් දවස, තව තවත් ඉදිරියට යන විට, බැතිමතුන්ගේ කන්නලව්වේ හඬත් ඔවුන්ගේ හැඟීමුත් ඔබට ඉතාමත් පැහැදිලිව අසන්නට ලැබේවි. ඔවුන්ගේ වඩාත් ආදරණීයම දේව දේවතාවියන් කවුරුන්දැයි කියා ඔබට දැනගත හැකි වේවි. තවත් ටිකක් ශක්තිමත් වන්න, දිව්‍යමය බුද්ධියක ස්පර්ෂයෙන්, ඔබට ඒ සියල්ල දිව්‍ය දර්ශනයකින් දකින්නා සේ ඉතාමත් පැහැදිලිව දැක ගත හැකි වේවි. දැනට ඔබව සරසවමිනුයි සිටින්නේ, එළිදරව්වේ තිරය තවමත් විවර වී නොමැත්තේ ඒ නිසායි. ඔබ හොඳින් සැරසුනු විට තිරය විවර වුණු විට ඔබට ඔබව දැක ගත හැකි වේවි. මේ මේ දේවතාවරයා පැමිණ සිටිනවා කියා එවිට සෑම කෙනෙකුගේම කටින් කියවේවි. අච්චා.

පහසු හා සැහැල්ලු ගති ස්වභාවයන් ඇති අහිංසක දරුවන්වත් පහසු යෝගීන් හා පරමාත්ම පියාට අයිති, අහිංසක ස්වාමීට අයිති තිතේ හා බින්දුවේ හරය නිරන්තරයෙන් තම දිවියට නිරන්තරයෙන් උකහා ගැනීමේ ප්‍රතිමූර්තීන් වන ජීවාත්මයන්ව, අධිෂ්ඨාන සිතිවිලි, වචන හා ක්‍රියා ශීලය රකිනා උතුම් ජීවාත්මයන්ව, තම වන්දනීය ස්වරූපයේ ස්ථාවරව සිටිනා වන්දනීය ජීවාත්මයන්ව සෙනෙහසින් සිහිපත් කර අහිංසකත්වයේ ස්වාමි වන පරමාත්ම පියා වරම් දානය කරන්නා භාග්‍යදානය කරන්නා ඔබට නමස්කාර කරයි.

**කොඩිය එසවීමෙන් පසුව බාප්දාදා කියූ මිහිරි වදන් :**

පරමාත්ම පියා කියනවාඃ දරුවන්ගේ කොඩිය සෑම විටෙකම හරිම ඉහළයි. දරුවන්ට නොවෙයි නම් පරමාත්ම පියා මොනවා කරන්න ද ? පියාගේ ධජය තමයි ශ්‍රේෂ්ඨම කියා ඔබලා කියනවා (ශිව් ධජය සෑම විටම ඉහළින්, යන ගීතය වාදනය කළා) නමුත් පියා කියන්නේ දරුවන්ගේ ධජය තමයි සෑම විටම ඉහළින් තිබෙන්නේ කියලයි. ජයග්‍රහණයේ ධජය සෑම විටම සෑම දරුවෙකුගේම නළල් තලයේ එසවී තිබෙනවා. ජයග්‍රහණයේ ධජය සෑම කෙනෙකුගේම දෑසේත් නළල් තලයේත් එසවී තිබෙනවා. ඔසවා තිබෙන්නේ එක් ධජයක් පමණක් නොවෙයි සෑම කෙනෙකුගේම නළල් තලයේ අවිනාශී ධජයක් එසවී තිබෙනවා. පරමාත්ම පියාගේත් දරුවන්ගේත් අපූරු උපන්දිනයට සුබ පැතුම්.

**පරමාත්ම පියාගේත් දරුවන්ගේත් අපූරු උපන්දිනයට සුබ පැතුම්:**

මෙම අලෞකික බ්‍රහමින් ජීවිතයේ උපන් දිනය වෙනුවෙන් ඔය සියලුම දරුවන්ට, සේවා සගයින් හා නිරන්තරයෙන් තම පියවර පරමාත්ම පියාගේ පියවර මත තබනා දරුවන් සෑම කෙනෙක්ටම සුබ පැතුම්. සෑම දරුවෙකුගේම සෙනෙහස, සිහි කිරීම හා සුභාශිංසන වෙනුවෙන් බාප්දාදාත් නිරන්තරයෙන් සෑම දරුවෙක්වම තම ආදරණීය හස්තයෙන් මල් මාලා පළන්දවා සුබ ප්‍රාර්ථනා කරනවා. ලෝකයේ සිටිනා සෑම ජීවාත්මයක්ම දරුවන්ගේ මෙම අලෞකික උපන් දිනය

සිහිවටනයක් ලෙසින් සමරමින් සිටියා, මන්ද සෑම ජීවාත්මයක්ම තමන්ගේ පරමාත්ම පියාගෙනුත් සෑම දරුවෙකුගේම බ්‍රහමින් ජීවිතයෙනුත් විශාල සහයෝගයක්, විශාල සතුටක්, සාමයක්, ප්‍රීතියක් හා බලයක් ලබා තිබෙනවා. මෙන්න මේ සහයෝගය නිසායි සෑම කෙනෙක්ම ශිවාගේ උපත් දිනය හා සලිග්‍රාමයින්ගේ උපත් දිනය ශිව් ජයන්තිය හද පිරි සෙනෙහසින් සමරන්නේ. එවන් සලිග්‍රම් දරුවන්ට ශිව් බාබාගෙනුත් බ්‍රහ්ම බාබාගෙනුත් නිරන්තර සුබ පැතුම් හිමි වෙනවා. දිගටම ඔබලාට සුබ පැතුම්. නිවැරදි ක්‍රමය මගින් ඔබලා අඛණ්ඩ වර්ධනයක් හා නොනවතින සාර්ථකත්වයක් ලබත්වා. අච්චා.

**සමුගන්නා මොහොතේ දී :** සෑම කෙනෙක්ම "සුබ උදෑසනක්" කියා කියනවා, නමුත් ඔබගේ උදෑසන පරමාත්ම දෙවියන් සමඟයි, එය දේව උදෑසනක්. ඔබ රාත්‍රිය පරමාත්ම දෙවියන් සමඟ සමරා දැන් දැන් උදෑසනත් ඒ දෙවියන් සමඟම සමරනවා. එමනිසා, සෑම විටම *God* හා *Good* සිහියේ තබා ගන්න. පරමාත්ම දෙවියන් පිළිබඳ සිහියේ සිටීම ඔබලාව හොඳ අයෙක් කරවනවා. පරමාත්ම දේව ස්මරණය නොතිබිණි නම් ඔබට හොඳ වෙන්නත් බැහැ. ඔබ සෑම කෙනෙක්ම නිරන්තරයෙන් දේව ජීවිතයක් ගත කරනවා, මෙන්න මේ නිසා තමයි ඔබගේ සෑම තත්පරයක්ම, සෑම සිතිවිල්ලක්ම හොඳ එකක් වන්නේ. ඉතින් එමනිසා එය නිකම්ම සුබ උදෑසනක්, සුබ සන්ධ්‍යාවක්, සුබ රාත්‍රියක් පමණක් නොවෙයි, ඔබගේ සෑම සිතිවිල්ලක්ම සෑම තත්පරයක්ම යහපත් වන්නේ ඔබ පරමාත්ම දේව සිහියේ සිටිනා නිසායි. මෙම අත්දැකීම ඔබට තිබෙනවා ද ? ඔබගේ ජීවිතයම දැන් හොඳයි, මන්ද ඔබ සිටින්නේ පරමාත්ම දෙවියන් සමඟයි. ඔබ කරනා සෑම ක්‍රියාවක්ම කරන්නේ පරමාත්ම දෙවියන් සමඟයි, එහෙම නේද ? ඔබ කිසිම දෙයක් තනිවම කරන්නේ නැහැ නේද ? ඔබ කෑම කන්නේත් පියා සමඟයි, තනියම කනවා ද ? සෑමවිටම *God* හා *Good* යන දෙකේ සම්බන්ධතාවය මතක තබාගෙන එය තම ජීවිතයට එකතු කර ගන්න. ඔබට තේරුණා ද ? අච්චා. මේ අම්රිත්වේලාවේ දී බාප්දාදා ඔය සෑම කෙනෙක්වම සුවිශේෂී අමරණීය සෙනෙහසින් සිහිපත් කර නමස්තේ කියයි.

වරදානය: ඔබ, "මාස්ටර් කරුණාවන්ත" වී මහා දානපතියෙක් විලසින් සතුටු සම්පත ලෝභ නැතිව බෙදාහරින්නෙක් වේවා.

තාවකාලික සතුටක් විඳීම සඳහා මිනිස්සු විශාල කාලයක් හා මුදලක් වියදම් කරනවා. ඒ කරලත් ඔවුනට සැබෑ සතුටක් ලැබෙන්නේ නැහැ. එවන් අත්‍යවශ්‍ය මොහොතක දී, ඔය ජීවාත්මයන් මහා දානපතීන් වී සතුටු සම්පත නිර්ලෝභීව දානය කළ යුතුයි. මේ සඳහා, කරුණා ගුණය ඉස්මතු කර ගන්න. ඔබගේ අජීවී පිළිම දර්ශන දානය කරනවා, ඉතින් ඔබලා සජීවී ස්වරූපයෙන් කරුණාවන්ත වී නොකඩවා දානය කළ යුතුයි, මන්ද ඒ ජීවාත්මයන් සිටින්නේ තවත් බලපෑමකට යට වෙලයි. මෙයා නම් කවදාවත් ඇහුම් කන් දෙන්නේ නැහැ, කියා කිසිදු විටෙක සිතන්න එපා : ඔබ කිසිදු සැකයකින් තොරව කරුණාවන්ත වී දිගටම දීම ම කරන්න. ඔබගේ සුබ පැතුම් අනිවාර්යෙන්ම ඔවුන්ට ඵල ගෙන දෙනු ඇත.

පාඨය : යෝග බලයෙන් තම සියලුම භෞතික ඉන්ද්‍රියන් තම අණසකට අනුව ක්‍රියාත්මක කරවන්නන් ස්ව–මාස්ටර් වරුන්, ස්වාධිපතීන් වේ.

***** ඕම් ශාන්ති*****